(නවවැනි පාර්ලිමේන්තුව -  පස්වැනි සභාවාරය)

අංක **2.**]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2024 පෙබරවාරි 08 බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා,** කථානායකතුමා

ගරු **අජිත් රාජපක්ෂ මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **අංගජන් රාමනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

---

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **මහින්ද අමරවීර මහතා,** කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,** ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ නිමල් සිරිපාල ද සිල්වා මහතා,** වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **ඩග්ලස් දේවානන්දා මහතා,** ධීවර අමාත්‍යතුමා

ගරු **නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **ප්‍රසන්න රණතුංග මහතා,** නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා,** අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා

ගරු **නීතිඥ පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය,** වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමිය සහ වාරිමාර්ග අමාත්‍යතුමිය

ගරු **සජිත් ප්‍රේමදාස මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු **රංජිත් සියඹලාපිටිය මහතා,** අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා සහ මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සීතා අරඹෙපොල මහත්මිය,** සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** ප්‍රවාහන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය,** කාන්තා හා ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **අ. අරවින්ද් කුමාර් මහතා,** අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් මහතා,** ග්‍රාමීය මාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. වී. චානක මහතා,** විදුලිබල හා බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ සිසිර ජයකොඩි මහතා,** දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අනුරාධ ජයරත්න මහතා,** අධිකරණ හා බන්ධනාගාර කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **චාමර සම්පත් දසනායක මහතා,** ප්‍රාථමික කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා,** කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රෝහණ දිසානායක මහතා,** ක්‍රීඩා හා යෞවන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජගත් පුෂ්පකුමාර මහතා,** විදේශ රැකියා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශාන්ත බණ්ඩාර මහතා,** ජනමාධ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **තාරක බාලසූරිය මහතා,** විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජිත බේරුගොඩ මහතා,** පිරිවෙන් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කේ. කාදර් මස්තාන් මහතා,** ග්‍රාමීය ආර්ථික රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ප්‍රසන්න රණවීර මහතා,** කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලොහාන් රත්වත්තේ මහතා,** වැවිලි කර්මාන්ත හා මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) සුරේන් රාඝවන් මහතා,** උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා,** වාරිමාර්ග හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජානක වක්කුඹුර මහතා,** පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **තේනුක විදානගමගේ මහතා,** නාගරික සංවර්ධන හා නිවාස රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **එස්. වියාලේන්ද්‍රන් මහතා,** වෙළඳ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,** විදුලිබල හා බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කනක හේරත් මහතා,** තාක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. බී. හේරත් මහතා,** පශු සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **ඒ. එල්. එම්. අතාඋල්ලා මහතා**

ගරු **කපිල අතුකෝරල මහතා**

ගරු **තිස්ස අත්තනායක මහතා**

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **රෝහිත අබේගුණවර්ධන මහතා**

ගරු **වජිර අබේවර්ධන මහතා**

ගරු **අශෝක් අබේසිංහ මහතා**

ගරු **තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**

ගරු **තවරාජා කලෛයි අරසන් මහතා**

ගරු ජේ. සී. අලවතුවල මහතා

ගරු ඩලස් අලහප්පෙරුම මහතා

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා

ගරු තිසකුට්ටි ආරච්චි මහතා

ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා

ගරු එම්. උදයකුමාර් මහතා

ගරු (ආචාර්ය) මේජර් ප්‍රදීප් උඳුගොඩ මහතා

ගරු සංජීව එදිරිමාන්න මහතා

ගරු ගයන්ත කරුණාතිලක මහතා

ගරු නීතිඥ සාගර කාරියවසම් මහතා

ගරු ෆයිසාල් කාසිම් මහතා

ගරු ජයන්ත කැටගොඩ මහතා

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු උදයන කිරිඳිගොඩ මහතා

ගරු ලලිත් වර්ණ කුමාර මහතා

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා

ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා

ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා

ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා

ගරු උදය ගම්මන්පිල මහතා

ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා

ගරු උදයකාන්ත ගුණතිලක මහතා

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය

ගරු යදාමිණී ගුණවර්ධන මහතා

ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු මිලාන් ජයතිලක මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු පියංකර ජයරත්න මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු දයාසිරි ජයසේකර මහතා

ගරු එම්. එස්. තවුෆික් මහතා

ගරු කුලසිංහම් තිලීපන් මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු දුමින්ද දිසානායක මහතා

ගරු එස්. බී. දිසානායක මහතා

ගරු මංජුලා දිසානායක මහත්මිය

ගරු විමලවීර දිසානායක මහතා

ගරු සාරතී දූෂ්මන්ත මහතා

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා

ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා

ගරු එච්. නන්දසේන මහතා

ගරු (වෛද්‍ය) ගයාෂාන් නවනන්ද මහතා

ගරු අසංක නවරත්න මහතා

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු නිමල් පියතිස්ස මහතා

ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා

ගරු ඩිලාන් පෙරේරා මහතා

ගරු නිරෝෂන් පෙරේරා මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය

ගරු ජගත් ප්‍රියංකර මහතා

ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය

ගරු රෝහණ බංඩාර මහතා

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා

ගරු සුදත් මංජුල මහතා

ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු නීතිඥ එස්. එම්. එම්. මුෂාරෆ් මහතා

ගරු මොහමඩ් මුසම්මිල් මහතා

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා

ගරු නිපුණ රණවක මහතා

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි

ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා

ගරු කුමාරසිරි රත්නායක මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා

ගරු චමල් රාජපක්ෂ මහතා

ගරු (වෛද්‍ය) තිලක් රාජපක්ෂ මහතා

ගරු මහින්ද රාජපක්ෂ මහතා

ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා

ගරු (ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා

ගරු එම්. රාමේෂ්වරන් මහතා

ගරු ගාමිණී වලේබොඩ මහතා

ගරු නයන වාසලතිලක මහතා

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය

ගරු සී. වී. විග්නේෂ්වරන් මහතා

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා

ගරු නීතිඥ මධුර විතානගේ මහතා

ගරු හේෂා විතානගේ මහතා

ගරු ජනාධිපති නීතිඥ ජයන්ත වීරසිංහ මහතා

ගරු ඩී. වීරසිංහ මහතා

ගරු වීරසුමන වීරසිංහ මහතා

ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා

ගරු ජගත් සමරවික්‍රම මහතා

ගරු ජයන්ත සමරවීර මහතා

ගරු රාජවරෝදයම් සම්පන්දන් මහතා

ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා

ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා

ගරු වඩිවේල් සුරේෂ් මහතා

**ගරු නීතිඥ ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා**

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**

**ගරු එච්. එම්. එම්. හරීස් මහතා**

**ගරු අබ්දුල් හලීම් මහතා**

**ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා**

**ගරු සමන්ප්‍රිය හේරත් මහතා**

**ගරු මර්ජාන් ෆලීල් මහතා**

**ගරු ඒ. එච්. එම්. ෆවුසි මහතා**

කුෂානි රෝහණදීර මහත්මිය, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

චමින්ද කුලරත්න මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

හංස අබේරත්න මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

1. **අභිනව මන්ත්‍රීවරයන්ගේ නිල ප්‍රතිඥාදීම හෝ දිවුරුම්දීම:** පුත්තලම මැතිවරණ කොට්ඨාසයේ පාර්ලිමේන්තු මන්ත්‍රී, ගරු ඇල්. කේ. ජගත් ප්‍රියංකර මහතා නීති ප්‍රකාර ප්‍රතිඥා දී සහා මේසය මත තබා ඇති පොතෙහි අත්සන් කළේය.

2. **කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන:** කථානායකවරයා විසින් මතු පළවන නිවේදන කරන ලදී:—

I

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාරව, මා විසින් 2024 ජනවාරි 31 දින 'සමථකරණය තුළින් ඇතිවන්නා වූ අන්තර්ජාතික නිරවුල්කරණ ගිවිසුම් පිළිගැනීමේ සහ බලාත්මක කිරීමේ' සහ 'නොතාරිස් (සංශෝධන)' නමැති පනත් කෙටුම්පත්වල සහ 2024 පෙබරවාරි 01 දින 'ජාතික ජලශාස්ත්‍රීය', 'අධිකරණයකට, විනිශ්චය අධිකාරයකට හෝ ආයතනයකට අපහාස කිරීම' සහ 'මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ' පනත් කෙටුම්පත්වල සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි."

II

"2024 ජනවාරි 23 දින මාගේ නිවේදනයෙහි සඳහන් පෙත්සම් හය සහ 2024 ජනවාරි 24 දින මාගේ නිවේදනයෙහි සඳහන් පෙත්සම් දහඅටට අමතරව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, 'ත්‍රස්ත විරෝධී' නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද තවත් පෙත්සම් හයක පිටපත් මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැනුම් දීමට කැමැත්තෙමි."

III

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 143 ප්‍රකාරව, නවවැනි පාර්ලිමේන්තුවේ පස්වැනි සභාවාරයේ සේවය කිරීම පිණිස මතු සඳහන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සභාපති නාමාවලියට ඇතුළත් කිරීමට මා විසින් නම් කර තිබෙන බව පාර්ලිමේන්තුවට දන්වනු කැමැත්තෙමි:—

ගරු නීතිඥ එස්. එම්. එම්. මුෂාරෆ් මහතා

ගරු වේලු කුමාර් මහතා

ගරු මයන්ත දිසානායක මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු හේෂා විතානගේ මහතා

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය

ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා

ගරු නීතිඥ මධුර විතානගේ මහතා

ගරු වීරසුමන වීරසිංහ මහතා

ගරු සමන්ප්‍රිය හේරත් මහතා

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය

ගරු ජගත් සමරවික්‍රම මහතා"

IV

"පුත්තලම දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු සනත් නිශාන්ත මහතාගේ අභාවය මෙම පාර්ලිමේන්තුවට මා දන්වා සිටින්නේ බලවත් කණගාටුවෙනි. එතුමාගේ හදිසි අභාවය පිළිබඳව අප දැඩිසේ කණගාටු වන අතර මෙම ගරු මන්ත්‍රීවරයාගේ පවුලේ අය වෙත අපගේ සාතිශය සංවේගය ප්‍රකාශ කරන බව පාර්ලිමේන්තුව වෙනුවෙන් මම දන්වනු කැමැත්තෙමි."

මේ පිළිබඳ ශෝක ප්‍රකාශ යෝජනාව මතු දිනයකදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ඇත.

V

"ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ වේත්‍රධාරී තනතුර සඳහා නියෝජ්‍ය වේත්‍රධාරී අධිකාරම්ගේ කුෂාන් සම්පත් ජයරත්න මහතා 2024 ජනවාරි 31 දින සිට බල පැවැත්වෙන පරිදි පත් කරනු ලැබ ඇති බව පාර්ලිමේන්තුවට දන්වනු කැමැත්තෙමි."

**3. ලිපිලේඛනාදිය පිළිගැන්වීම:** (1) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් 2018 සහ 2019 වර්ෂ සඳහා සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගමේ වාර්ෂික වාර්තා ඉදිරිපත් කර, එම වාර්තා ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(2) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින්—

(i) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ අමාත්‍ය මණ්ඩල කාර්යාලය සම්බන්ධ කරුණු පිළිබඳ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව; සහ

(ii) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ පරිසර අමාත්‍යාංශය සම්බන්ධ කරුණු පිළිබඳ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව

ඉදිරිපත් කර, එම වාර්තා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල් ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2024 ජනවාරි 11 දිනැති අංක 2366/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රෙගුලාසි ඉදිරිපත් කර, එම රෙගුලාසි රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් 1979 අංක 61 දරන අත්‍යාවශ්‍ය මහජන සේවා පනතේ 2 වගන්තිය ප්‍රකාරව ජනාධිපතිවරයා වෙත පැවරී ඇති බලතල අනුව, 2024 පෙබරවාරි 03 දිනැති අංක 2369/58 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ හා එහි උපලේඛනයෙහි පළ කරමින් කරන ලද ප්‍රකාශනය ඉදිරිපත් කරන ලදී.

එම ලේඛනය, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(5) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින්—

(i) 2021 වර්ෂය සඳහා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2022 වර්ෂය සඳහා සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ වාර්ෂික වාර්තාව

ඉදිරිපත් කර, එම වාර්තා ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(6) වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා විසින් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ ගුදම් පහසුකම්, බහාලුම් අංගන, වරාය සැපයුම් පහසුකම් සහ බෝට්ටු හා නැව් කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය සම්බන්ධ කරුණු පිළිබඳ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(7) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින්—

(i) 2022 වර්ෂය සඳහා ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ වාර්ෂික වාර්තාව;

(ii) 2022 වර්ෂය සඳහා සෙන්ට්‍රල් ඉංජිනියරින් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනයේ වාර්ෂික වාර්තාව; සහ

(iii) 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාවේ වාර්ෂික වාර්තාව

ඉදිරිපත් කර, එම වාර්තා ආහාර සුරක්ෂිතතාව හා කෘෂිකර්මය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(8) අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් (218 අධිකාරය වූ) විෂවර්ග, අබිං සහ අන්තරාදායක ඖෂධ වර්ග ආඥාපනතේ 77අ(6) වගන්තිය සමඟ කියවිය යුතු 80 වගන්තිය යටතේ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2023 නොවැම්බර් 27 දිනැති අංක 2360/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග ඉදිරිපත් කර, එම නියෝග අදාළ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී..

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(9) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව මාධ්‍ය, තාරුණ්‍ය, උරුමය හා නූතන පුරවැසියා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(10) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් 2020 වර්ෂය සඳහා ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව භාණ්ඩ හා සේවා අපනයන ඉහළ නැංවීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(11) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම සම්බන්ධ කරුණු පිළිබඳ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**4.පාර්ලිමේන්තුවේ රැස්වීම්:** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව: පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. පූ.භා. 9.30ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 5.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**5. තේරීම් කාරක සභාව (අංක 1):** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 114හි විධිවිධාන ප්‍රකාරව, නවවැනි පාර්ලිමේන්තුවේ පස්වැනි සභාවාරයේ සේවය කිරීම සඳහා තේරීම් කාරක සභාව, කථානායකවරයාගේ සභාපතිත්වයෙන් සහ දේශපාලන පක්ෂවල නායකයන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් ද ඇතුළත්ව පාර්ලිමේන්තුව විසින් නම් කරනු ලබන සාමාජික මන්ත්‍රීවරයන් දොළොස් දෙනෙකුගෙන් (12) සමන්විත විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**6.තේරීම් කාරක සභාව (අංක 2):** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,—අද දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව, මතු සඳහන් සාමාජික මන්ත්‍රීවරයන් නවවැනි පාර්ලිමේන්තුවේ පස්වැනි සභාවාරයේ තේරීම් කාරක සභාවේ සේවය කළ යුතු ය:—

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා

ගරු ප්‍රසන්න රණතුංග මහතා

ගරු නීතිඥ නිමල් සිරිපාල ද සිල්වා මහතා

ගරු ඩග්ලස් දේවානන්දා මහතා

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා

ගරු ගයන්ත කරුණාතිලක මහතා

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු විජිත හේරත් මහතා

ගරු අමීර්තනාදන් අඩෛක්කලනාදන් මහතා

ගරු නීතිඥ සාගර කාරියවසම් මහතා

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**7.කල් තැබීම (නවවැනි පාර්ලිමේන්තුවේ පස්වැනි සභාවාරය විවෘත කරමින් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ ප්‍රතිපත්ති ප්‍රකාශනය):** ''මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය''යි පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

(පූ.භා.10.45 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

''ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය මූලාසනාරූඪ විය යුතු ය'' යි වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(පූ.භා. 11.55 ට ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය මූලාසනාරූඪ වූවා ය.)

''ගරු ජගත් සමරවික්‍රම මහතා මූලාසනාරූඪ විය යුතු ය'' යි අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 1.12 ට ගරු ජගත් සමරවික්‍රම මහතා මූලාසනාරූඪ විය.)

(අ.භා. 1.24 ට නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා මූලාසනාරූඪ විය.)

''ගරු වීරසුමන වීරසිංහ මහතා මූලාසනාරූඪ විය යුතු ය'' යි කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 2.35 ට ගරු වීරසුමන වීරසිංහ මහතා මූලාසනාරූඪ විය.)

''ගරු සමන්ප්‍රිය හේරත් මහතා මූලාසනාරූඪ විය යුතු ය'' යි වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍ය සහ වාරිමාර්ග අමාත්‍යවරිය විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 4.31 ට ගරු සමන්ප්‍රිය හේරත් මහතා මූලාසනාරූඪ විය.)

විවාදය කල් ගියේය. එතැන් සිට විවාදය 2024 පෙබරවාරි 09 සිකුරාදා පවත්වනු ලැබේ.

එකල්හි වේලාව අ.භා 5.30 වූයෙන් මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින් අද දින සභා සම්මතිය අනුව ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

ඊට අනුකූලව, පාර්ලිමේන්තුව 2024 පෙබරවාරි 09 සිකුරාදා පූ.භා. 9.30 වනතෙක් කල් ගියේය.